# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1990 අංක 19 දරන
# පළාත්බද මහාධිකරණ (විශේෂ විධිවිධාන) පනත

---

[සහතිකය සටහන් කළේ 1990 මැයි මස 15 වන දින.]

**ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.**

---

1990 මැයි මස 18 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ගත හැකිය

මිල: ශත 90 යි. තැපැල් ගාස්තුව: රු. 1.00 යි

# 1990 අංක 19 දරන පළාත් බද මහාධිකරණ (විශේෂ විධිවිධාන) පනත

[සහතිකය සටහන් කළේ 1990 මැයි මස 15 වන දින]

එල්. ඩී.—ඕ. 31/89

**ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව යටතේ පිහිටුවනු ලබන මහාධිකරණයෙහි අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය සම්බන්ධයෙන් සහ ඒ අධිකරණය වෙත සහ ඒ අධිකරණයෙන් අභියාචනය කිරීමේ අයිතිය පිළිබඳව ද, ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සම්බන්ධයෙන් ද විධිවිධාන සැලැස්වීම සඳහා වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත, 1990 අංක 19 දරන පළාත් බද මහාධිකරණ (විශේෂ විධිවිධාන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. කෙටි නාමය.

2. (1) ශ්‍රී ලංකාවේ මහාධිකරණයෙහි මුල් අපරාධ අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමට සහ ඒ මහාධිකරණය වෙතින් අභියාචනාධිකරණය වෙත කරනු ලබන අභියාචනාවලට අදාළ ලිඛිත නීතියෙහි විධිවිධාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මගින් පිහිටුවන ලද මහාධිකරණයක් විසින්, එය වෙත පවරනු ලැබ ඇති මුල් අපරාධ අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමේදී— මහාධිකරණයේ මුල් අපරාධ අධිකරණ බලය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් කාර්ය පටිපාටිය.

(අ) ඒ මහාධිකරණයෙහි (ජූරි සභාවක් මගින් නඩු විභාග කිරීම සහ විශේෂ අධිකරණ විභාග ඇතුලුව) නඩු කටයුතු පැවරීම සහ නඩු විභාගවලට අදාළ කාර්ය පටිපාටිය ;

(ආ) ඒ මහාධිකරණය විසින් සටහන් කරන ලද නැතහොත් පනවන ලද, නඩු තීන්දු, වරදකරු කිරීම්, ආඥා හෝ දණ්ඩන නියම කෙරෙන අභියාචනාධිකරණය වෙත අභියාචනය කිරීමේ අයිතිය ;

(ඇ) ඒ මහාධිකරණය විසින් සටහන් කරන ලද නැතහොත් පනවන ලද, නඩු තීන්දු, වරදකරු කිරීම්, ආඥා හෝ දණ්ඩන නියම වෙතින් අභියාචනාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද අභියාචනා, ඒ අභියාචනාධිකරණය විසින් විභාග කරනු ලැබීම

සම්බන්ධයෙන්, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ විය යුතු ය.

(2) යම් අධිකරණයක් ඉදිරියෙහි විනිශ්චයට භාජනව පවත්නා යම් නඩුවක්, අපරාධ නඩුවක්, නඩු කටයුත්තක් හෝ කාරණයක් වෙනත් යම් අධිකරණයකට පැවරීම සම්බන්ධයෙන් අදාළ වන, අධිකරණ සංවිධාන පනතේ විධිවිධාන, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මගින් යම් පළාතක් සඳහා පිහිටුවන ලද, යම් මහාධිකරණයක් ඉදිරියෙහි විනිශ්චයට භාජනව පවත්නා යම් නඩුවක්, අපරාධ නඩුවක්, නඩු කටයුත්තක් හෝ කාරණයක් ඒ ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද වෙනත් යම් මහාධිකරණයකට පැවරීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(3) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මගින් පිහිටුවනු ලද, මහාධිකරණයකට එරෙහිව කරනු ලබන අපහාස කිරීමේ නැත හොත් එහි බලයට නිගරු කිරීමේ වැරදි සම්බන්ධයෙන් අධිකරණ සංවිධාන පනතේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු ය.

කම්කරු විනිශ්චයාධිකාර වලින් සහ ගොවිජන සේවා පනත යටතේ නියම වලින් කරනු ලබන අභියාචන විභාග කිරීම සම්බන්ධයෙන් මහාධිකරණයේ අධිකරණ බලය.

3. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මගින්, පළාතක් සඳහා පිහිටුවනු ලැබූ මහාධිකරණයක් විසින්, යම් නීතියකට යටත්ව, ඒ පළාත ඇතුළත වූ කම්කරු විනිශ්චයාධිකාරය විසින් කරන ලද ආඥා සම්බන්ධයෙන් ද, ඒ පළාත ඇතුළත පිහිටි යම් ඉඩමක් සම්බන්ධයෙන් 1979 අංක 58 දරන ගොවිජන සේවා පනතේ 5 වන වගන්තිය හෝ 9 වන වගන්තිය හෝ යටතේ කරන ලද නියම සම්බන්ධයෙන් ද අභියාචන සහ ප්‍රතිශෝධන අධිකරණ බලය ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

මහාධිකරණය වෙත අභියාචනය කිරීමේ අයිතිය.

4. මහෙස්ත්‍රාත් අධිකරණයක්, ප්‍රාථමික අධිකරණයක්, කම්කරු විනිශ්චයාධිකාරයක් විසින් සටහන් කරන ලද නැතහොත් පන වන ලද යම් වරදකරු කිරීමකින්, දණ්ඩන නියමයකින් හෝ ආඥා වකින් නැතහොත්, 1979 අංක 58 දරන ගොවිජන සේවා පනතේ 5 වන වගන්තිය හෝ 9 වන වගන්තිය හෝ යටතේ කරන ලද නියමයකින් අතෘප්තියට පත් පාර්ශ්වයක් විසින්, අභියාචනය කිරීම සඳහා වූ කාර්ය පටිපාටියට හා විධි ක්‍රමයට සහ එවැනි අභියාචන ඉදිරිපත් කිරීම සඳහා වූ කාලයට අදාළ යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, එම වරදකරු කිරීම, දණ්ඩන නියමය, ආඥාව නැතහොත් නියමය සම්බන්ධයෙන්, ඒ අධිකරණය හෝ විනිශ්චයාධිකාරය පිහිටා ඇති නැතහොත්, ගොවිජන සේවා පනත යටතේ කරන ලද නියමයට යටත් ඉඩම පිහිටා ඇති පළාත සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මගින් පිහිටුවන ලද මහාධිකරණය වෙත අභියාචනය කරනු ලැබිය හැකිය.

මහාධිකරණය වෙත අභියාචනය කිරීම සඳහා වූ කාර්ය පටිපාටිය.

5. මහේස්ත්‍රාත් අධිකරණයක් විසින් සටහන් කරන ලද නැත හොත් පනවන ලද වරදකරු කිරීම්වලින්, දණ්ඩන නියමවලින් හෝ ආඥාවලින් අභියාචනාධිකරණය වෙත කරනු ලබන අභියාචන වලට සහ එවැනි කිසියම් වරදකරු කිරීමක්, දණ්ඩන නියමයක් හෝ ආඥාවක් ප්‍රතිශෝධනය කිරීම සඳහා අභියාචනාධිකරණය වෙත කරනු ලබන ඉල්ලීම්වලට අදාළ වන ලිඛිත නීතියේ විධිවිධාන, යම් පළාතක මහෙස්ත්‍රාත් අධිකරණ, ප්‍රාථමික අධිකරණ සහ කම්කරු විනිශ්චයාධිකාර විසින් සටහන් කරන ලද හෝ පනවන ලද වරද කරු කිරීම්, දණ්ඩන නියම සහ ආඥා වෙතින් සහ ඒ පළාත ඇතුළත පිහිටා ඇති ඉඩම් සම්බන්ධයෙන් 1979 අංක 58 දරන ගොවිජන සේවා පනතේ 5 වගන්තිය හෝ 9 වන වගන්තිය යටතේ කරන

ලද නියම වෙතින්, ඒ පළාත සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මගින් පිහිටුවන ලද මහාධිකරණය වෙත කරනු ලබන අභියාචන සහ එවැනි යම් වරදකරු කිරීමක් දණ්ඩන නියමයක් ආඥාවක් හෝ නියමයක් ප්‍රතිශෝධනය කිරීම සඳහා ඒ මහාධිකරණය වෙත කරනු ලබන ඉල්ලීමක් සම්බන්ධයෙන්, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ විය යුතු ය.

අභියාචනයක් කිරීමේ දී මහාධිකරණය සතු බලතල.

**6.** (අ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද මහාධිකරණයක් විසින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් හෝ 3 වන වගන්තිය මගින් හෝ වෙනත් යම් නීතියක් මගින් හෝ ඒ මහාධිකරණය වෙත පැවරී ඇති යම් අභියාචන අධිකරණ බලයක් ක්‍රියාත්මක කිරීමේ දී යම් ආඥාවක්, තඩු තීන්දුවක්, තීන්දු ප්‍රකාශයක් හෝ දණ්ඩන නියමයක්, නීතියට අනුව ස්ථිර කිරීම, ප්‍රතිවර්තනය කිරීම, නිවැරදි කිරීම හෝ සුළු වශයෙන් වෙනස් කිරීම හෝ යම් මූල් අවස්ථා අධිකරණයකට හෝ විනිශ්චයාධිකාරයකට හෝ ආයතනයකට හෝ විධාන කිරීම නැත හොත් අධිකරණය සුදුසු යයි කල්පනා කරන නියම මත අලුත් නඩු විභාගයක් හෝ මැඩිදුර විභාගයක් හෝ පවත්වන ලෙස ආඥා කිරීම, කරනු ලැබිය හැකි ය.

(ආ) මහාධිකරණය විසින්, නඩුවේ යුක්තිය ඉෂ්ට කිරීම සඳහා අවශ්‍ය ප්‍රමාණයට මූල් නඩුවක, සිවිල් නඩුවක, අපරාධ නඩුවක හෝ නඩුවක විසඳිය යුතු කරුණුවලට සම්බන්ධව, මූල් අවස්ථා අධිකරණයෙහි දැනටමත් ලබා ගෙන ඇති සාක්ෂිවලට අතිරේකව හෝ ඒවාට ව්‍යතිරේක වශයෙන් අලුත් සාක්ෂි වැඩිදුරටත් ලබා ගෙන පිළිගනු ලැබිය හැකි ය.

මහාධිකරණයේ රිට් ආඥා අධිකරණ බලය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් කාර්ය පටිපාටිය.

**7.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 140 වන සහ 141 වන ව්‍යවස්ථා මගින්, අභියාචනාධිකරණය වෙත පැවරී ඇති අධිකරණ බලය ක්‍රියාවේ යොදවන ලෙස ඉල්ලමින්, අභියාචනාධිකරණය වෙත කරනු ලබන ඉල්ලීම්වලට අදාළ වන ලිඛිත නීතිවල විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මගින් පිහිටුවන ලද මහාධිකරණයක් වෙත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාවේ (4) වන අනුව්‍යවස්ථාව මගින් පැවරී ඇති අධිකරණ බලය ක්‍රියාවේ යොදවන ලෙස කරනු ලබන ඉල්ලීම්වලට අදාළ විය යුතු ය.

මූලික අයිතිවාසිකම් සහ භාෂා අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමට අදාළ නඩු ශ්‍රේෂ්ඨාධිකරණය වෙත යොමු කිරීම.

**8.** (1) හේබියස් කෝපුස්, සර්ටියෝරාරි, තහනම්, ප්‍රොසිඩෙන්ඩෝ, මැන්ඩාමුස් හෝ ක්වෝ වොරන්ටෝ යන ස්වභාවයේ වූ රිට් ආඥාවක් සඳහා වූ ඉල්ලීමක් සම්බන්ධයෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මගින් පිහිටුවන ලද මහාධිකරණයක නඩු විභාගයක් පැවැත්වෙන අතරතුර දී, ඒ ඉල්ලීමෙහි පාර්ශ්වකරුවකු විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ හෝ IV වන පරිච්ඡේදයේ හෝ විධිවිධාන උල්ලංඝනය කරනු ලබන බවට හෝ උල්ලංඝනය කරනු ලැබීමට ආසන්න බවට හෝ බැලූ බැල්මට පෙනෙන සාක්ෂි ඇතැයි ඒ අධිකරණයට පෙනී යන අවස්ථාවක, ඒ අධිකරණය, ඒ කාරණය වහාම, ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීරණය කරනු ලැබීම සඳහා යොමු කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියෙහි සඳහන් යම් යොමු කිරීමක් සම්බන්ධයෙන්, අවස්ථානුගත කරුණු අනුව යුක්ති සහගතයයි සහ සාධාරණයයි ශ්‍රේෂ්ඨාධිකරණය සලකන යම් සහන සැලසීමේ හෝ විධාන කිරීමේ නැතහොත්, මූලික අයිතිවාසිකමක් හෝ භාෂා අයිතිවාසිකමක් උල්ලංඝනය වීමක් නොමැති බව ශ්‍රේෂ්ඨාධිකරණයේ මතය වේ නම්, ඒ කාරණය ඒ මහාධිකරණය වෙත ආපසු යැවීමේ බලය ශ්‍රේෂ්ඨාධිකරණයට තිබිය යුතු ය.

(3) මේ වගන්තිය යටතේ යොමු කිරීමක් කිරීමෙන් මාස දෙකක් ඇතුළත දී, ඒ යොමු කිරීම, ශ්‍රේෂ්ඨාධිකරණය විසින් විභාග කර අවසාන වශයෙන් සුදුසුසක් කරනු ලැබිය යුතු ය.

**ඇතැම් නඩුවලදී මහාධිකරණයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අභියාචනය කිරීම.**

9. මේ පනතේ හෝ වෙනත් යම් නීතියක විධිවිධානවලට යටත් ව,—

(අ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මගින් පිහිටුවන ලද මහාධිකරණයක, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග වන ව්‍යවස්ථාවේ 3 (ආ) අනුව්‍යවස්ථාවෙන් හෝ, මේ පනතේ 3 වන වගන්තියෙන් හෝ වෙනත් යම් නීතියකින් එය වෙත පැවරී ඇති අභියාචන අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමෙහි ලා සැලකිය යුතු නීතිමය ප්‍රශ්නයක් අඩංගු යම් සිවිල් හෝ අපරාධ කාරණයක දී හෝ නඩු කටයුත්තක දී එම අධිකරණයේ අවසාන ආඥාවකින්, නඩු තීන්දුවකින්, තීන්දු ප්‍රකාශයකින් හෝ දණ්ඩන නියමයකින් අතෘප්තියට සම්බන්ධ අතෘප්තියට පත් යම් පාර්ශ්වයක මෙහෙයවීමෙන් ම හෝ ඒ කාරණයට හෝ නඩු කටයුත්තට සම්බන්ධ අතෘප්තියට පත් යම් පාර්ශ්වයක මෙහෙයවීම පිට ශ්‍රේෂ්ඨාධිකරණයට අභියාචනය කිරීමට මහාධිකරණය විසින් අවසර දෙනු ලැබුවහොත්, ඒ අවසාන ආඥාවෙන්, නඩු තීන්දුවෙන්, තීන්දු ප්‍රකාශයෙන් හෝ දණ්ඩන නියමයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අභියාචනය කරනු ලැබිය හැකි ය :

එසේ වුවද, ඒ මහාධිකරණය විසින් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අභියාචනය කිරීමට අවසර දීම ප්‍රතික්ෂේප කර ඇති අවස්ථාවක හෝ, ඒ නඩුව හෝ කාරණය ශ්‍රේෂ්ඨාධිකරණය විසින් සමාලෝචනය කරනු ලැබීම යෝග්‍ය බව ශ්‍රේෂ්ඨාධිකරණයේ මතය වන අවස්ථාවක, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග වන ව්‍යවස්ථාවේ 3(ආ) අනුව්‍යවස්ථාවෙන් හෝ මේ පනතේ 3 වන වගන්තියෙන් හෝ වෙනත් යම් නීතියකින් හෝ මහාධිකරණය වෙත පැවරී ඇති අභියාචන අධිකරණය බලය ක්‍රියාත්මක කිරීමේ දී, ශ්‍රේෂ්ඨාධිකරණය විසින්, ඒ මහාධිකරණය විසින් කරන ලද යම් අවසාන හෝ අතුරු ආඥාවකින්, නඩු තීන්දුවකින්, තීන්දු ප්‍රකාශයකින් හෝ දණ්ඩන නියමයකින් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අභියාචනය කිරීම සඳහා විශේෂ අවසරය එහි අභිමතය පරිදි දෙනු ලැබිය හැකි ය :

එසේම තවදුරටත්, තීරණය කිරීමට ඇති ප්‍රශ්නය ජනතාව සම්බන්ධයෙන් වැදගත් වන හෝ පොදු වැදගත්කමක් ඇති ප්‍රශ්නයක් බවට ශ්‍රේෂ්ඨාධිකරණය සෑහීමට පත්වන සෑම කාරණයක දීම හෝ නඩු කටයුත්තක දී ම ශ්‍රේෂ්ඨාධිකරණය විසින් අභියාචනය කිරීම සඳහා අවසර දෙනු ලැබිය යුතු ය; තවද

(ආ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මගින් පිහිටුවන ලද මහාධිකරණයක් විසින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග (3) (අ) හෝ (4) වන අනුව්‍යවස්ථා මගින් ඒ මහාධිකරණය වෙත පැවරී ඇති අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමෙහි ලා කරන ලද අවසාන ආඥාවකින්, නඩු තීන්දුවකින් හෝ දණ්ඩන නියමයකින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින්, ඒ අවසාන ආඥාවෙන්, නඩු තීන්දුවෙන් හෝ දණ්ඩන නියමයෙන් අභියාචනාධිකරණය වෙත අභියාචනය කරනු ලැබිය හැකි ය.

අභියාචනා සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය සතු බලතල.

10. (1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මගින් පිහිටුවන ලද මහාධිකරණයක් විසින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාවේ (3) (ආ) අනුව්‍යවස්ථාවෙන් හෝ මේ පනතේ 3 වන වගන්තියෙන් හෝ වෙනත් යම් නීතියකින් එය වෙත පැවරී ඇති අභියාචන අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමෙහි ලා සිදු කරන ලද සිද්ධිය පිළිබඳව හෝ නීතිය පිළිබඳව හෝ කරනු ලබන සියලු වැරදි නිවැරදි කිරීම සඳහා, ශ්‍රේෂ්ඨාධිකරණය ශ්‍රී ලංකාව තුළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට යටත්ව අභියාචන අධිකරණ බලය ඇති අවසාන අධිකරණය විය යුතු අතර, ඒ සෑම අවස්ථාවකම ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු තීන්දු සහ ආඥා එවැනි සෑම කාරණයක දී ම අවසානාත්මක හා නීරණාත්මක විය යුතු ය.

(2) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මගින් පිහිටුවන ලද මහාධිකරණයක් විසින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාවේ (3) (ආ) අනුව්‍යවස්ථාව හෝ මේ පනතේ 3 වන වගන්තිය හෝ වෙනත් යම් නීතියක් හෝ මගින්, ඒ මහාධිකරණය වෙත පැවරී ඇති අභියාචන අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමේ දී, ඒ අධිකරණය විසින් කරන ලද යම් ආඥාවකින්, නඩු තීන්දුවකින්, තීන්දු ප්‍රකාශයකින් හෝ දණ්ඩන නියමයකින් කරනු ලබන අභියාචනයක දී ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ස්වකීය අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමෙහිලා ඒ අභියාචනය සංජානනය කිරීමේ තනි හා අනන්‍ය අධිකරණ බලය ශ්‍රේෂ්ඨාධිකරණයට තිබිය යුතු අතර එවැනි මහාධිකරණයක යම් ආඥාවක්, නඩු තීන්දුවක්, තීන්දු ප්‍රකාශයක් හෝ දණ්ඩන නියමයක් ස්ථිර කිරීම, ප්‍රතිවර්ධනය කිරීම හෝ වෙනස් කිරීම ශ්‍රේෂ්ඨාධිකරණය විසින් කළ හැකිය. තවද, ඒ මහාධිකරණයට හෝ මුල් අවස්ථා අධිකරණයට යුක්ති ධර්මය අනුව අවශ්‍ය විය හැකි පරිදි, විධාන නිකුත් කිරීම හෝ අලුතෙන් නඩු විභාගයක් පවත්වන ලෙස ආඥා කිරීම හෝ යම් නඩු කටයුත්තක් තවදුරටත් විභාග කරගෙන යන ලෙස ආඥා කිරීම හෝ ශ්‍රේෂ්ඨාධිකරණය විසින් කළ හැකිය. එසේම යුක්තිය ඉටු කිරීම සඳහා අවශ්‍ය වේ නම්, අලුත් හෝ අතිරේක සාක්ෂි කැඳවා ඒවා භාර ගැනීම ද, එවැනි අවස්ථාවක දී, ඒ සාක්ෂි මහාධිකරණය විසින් හෝ යම් මුල් අවස්ථා අධිකරණයක් විසින් හෝ සටහන් කළ යුතු බව විධාන කිරීම ද ශ්‍රේෂ්ඨාධිකරණය විසින් කළ හැකි ය.

මහාධිකරණයෙන් අභියාචනාධිකරණය වෙත අභියාචනය කිරීම.

**11.** (1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද යම් මහාධිකරණයක් විසින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාවේ (3) (අ) හෝ (4) වන අනුව්‍යවස්ථාව යටතේ එහි අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමේ දී සිද්ධි පිළිබඳව හෝ නීතිය පිළිබඳව කරන ලද සියලුම වැරදි නිවැරදි කිරීම සඳහා වූ අභියාචන අධිකරණ බලය ද ඒ මහාධිකරණය විසින් සංජානනය කරන ලද සියලු නඩු නිමිති, සිවිල් නඩු, නඩු, අපරාධ නඩු, කාරණා හා දේවල් පිළිබඳ අභියාචනය, ප්‍රතිශෝධනය හා යථා තත්ත්වයට පැමිණවීම මගින් සංජානනය කිරීමේ තනි හා අනන්‍ය බලය ද මේ පනතේ හෝ වෙනත් යම් නීතියක හෝ විධිවිධානවලට යටත්ව අභියාචනාධිකරණයට තිබිය යුතු අතර අභියාචනාධිකරණය විසින් ඒ බලතල ඒ විධිවිධානවලට යටත්ව ක්‍රියාත්මක කළ යුතු ය :

එසේ වුවද, යම් වරදක හෝ දෝෂයක හෝ අවිධිමත් භාවයක, හේතුවෙන් නඩුවේ පාර්ශ්වකරුවන්ගේ වැදගත් අයිතිවාසිකම් වලට හානියක් සිදුවී නොමැති නම් නැතහොත් යුක්තිය ඉටු නොවීමක් සිදුවී නොමැතිනම් එවැනි වරදක්, දෝෂයක් හෝ අවිධිමත් භාවයක් නිසා, එවැනි යම් මහාධිකරණයක් කිසිම නඩු තීන්දුවක්, තීන්දු ප්‍රකාශයක් හෝ ආඥාවක් ප්‍රතිවර්තනය කිරීම නැතහොත් වෙනස් කිරීම නොකළ යුතු ය.

(2) අභියාචනාධිකරණය විසින් ස්වකීය අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමේ දී, යම් ආඥාවක්, නඩු තීන්දුවක්, තීන්දු ප්‍රකාශයක් හෝ දණ්ඩන නියමයක් නීතිය අනුව ස්ථිර කිරීම, ප්‍රතිවර්තනය කිරීම, නිවැරදි කිරීම හෝ සුළු වශයෙන් වෙනස් කිරීම හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද යම් මහාධිකරණයට විධාන නිකුත් කිරීම හෝ සුදුසු යයි අභියාචනාධිකරණය සලකන නියමයන් මත, අලුතෙන් නඩු විභාගයක් හෝ වැඩිදුර නඩු විභාගයක් පවත්වන ලෙස ආඥා කිරීම කරනු ලැබිය හැකි ය.

(3) යම් මුල් නඩුකරයක දී, සිවිල් නඩුවක දී, අපරාධ නඩුවක දී හෝ නඩුවක දී ප්‍රස්තුත කාරණාවලට අදාළව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මගින් පිහිටුවන ලද යම් මහාධිකරණයක් විසින් දැනටමත් ලබාගෙන ඇති සාක්ෂිවලට අමතරව හෝ පරිපූරකව යුක්ති ධර්මය අනුව අවශ්‍ය විය හැකි අලුත් සාක්ෂි වැඩිදුරටත් භාර ගැනීම හා පිළිගැනීම අභියාචනාධිකරණය විසින් කළ හැකි ය.

එකම කාරණය සම්බන්ධයෙන් අභියාචනය හෝ ඉල්ලීම හෝ අභියාචනාධිකරණ මෙන්ම මහාධිකරණයට ඉදිරිපත් කර ඇති අවස්ථාවක.

**12.** (අ) යම් අභියාචනයක් හෝ ඉල්ලීමක් ඒ අභියාචනය හෝ ඉල්ලීම ඉදිරිපත් කිරීම සඳහා ඉඩ දී ඇති කාලය ඇතුළත, අභියාචනාධිකරණය වෙත ඉදිරිපත් කොට ඇත්තා වූ ද, ඒ කාරණයම සම්බන්ධයෙන් වූ අභියාචනයක් හෝ ඉල්ලීමක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මගින් පිහිටුවන ලද මහාධිකරණයක් වෙත, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාවේ (3) (අ) හෝ (4) වන අනුව්‍යවස්ථා මගින් ඒ අධිකරණය වෙත පැවරී ඇති අධිකරණ බලය ක්‍රියාත්මක කරන ලෙස ඉල්ලමින් ඉදිරිපත් කරනු ලැබ ඇත්තා වූ ද ඒ අභියාචනය හෝ ඉල්ලීම හෝ විභාග

කිරීම ඒ මහාධිකරණය විසින් ආරම්භ කර නොමැත්තා වූ ද අවස්ථාවක, අභියාචනාධිකරණය විසින් ඒ අභියාචනය හෝ ඉල්ලීම විභාග කර තීරණය කරනු ලැබිය හැකි ය; නැතහොත් ඒ අභියාචනය හෝ ඉල්ලීම මහාධිකරණය විසින් විභාග කර තීරණය කිරීම යෝග්‍ය යයි අභියාචනාධිකරණය සලකන අවස්ථාවක, එසේ කරන ලෙස මහාධිකරණයට විධාන කරනු ලැබිය හැකි ය:

එසේ වුව ද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මගින් පිහිටුවන ලද මහාධිකරණයක අධිකරණ බලය ඇතුළත වූ යම් අභියාචනයක් හෝ ඉල්ලීමක් අභියාචනාධිකරණය වෙත ඉදිරිපත් කර ඇති අවස්ථාවක, ඒ අභියාචනය හෝ ඉල්ලීම මහාධිකරණය වෙත මාරු කිරීම යෝග්‍ය යයි අභියාචනාධිකරණය සලකන්නේ නම් ඒ අභියාචනය හෝ ඉල්ලීම ඒ මහාධිකරණය වෙත මාරු කරන ලෙස අභියාචනාධිකරණය විසින් ආඥා කරනු ලැබිය හැකි අතර, ඒ මහාධිකරණය විසින් ඒ අභියාචනය හෝ ඉල්ලීම විභාග කර තීරණය කරනු ලැබිය යුතු ය.

(ආ) (අ) ඡේදයෙහි විධිවිධාන සලසා ඇති පරිදි එවැනි යම් අභියාචනයක් හෝ ඉල්ලීමක් විභාග කොට තීරණය කිරීමට අභියාචනාධිකරණය තීරණය කරන අවස්ථාවක, මහාධිකරණයෙහි විනිශ්චයට භාජනව පවත්නා නඩු කටයුතු අභියාචනාධිකරණයෙහි තීරණය සඳහා අභියාචනාධිකරණය වෙත පැවරුණ සේ පැවතිය යුතු ය.

(ඇ) එවැනි අභියාචනයක් හෝ ඉල්ලීමක්, විභාග කර තීරණය කිරීමට හෝ මහාධිකරණයකට මාරු කිරීමට හෝ මේ වගන්තිය යටතේ අභියාචනාධිකරණය විසින් ගන්නා ලද තීරණයක් සම්බන්ධයෙන් අභියාචනයක් නොතිබිය යුතු ය.

(ඈ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මගින් පිහිටුවන ලද මහාධිකරණයක් විසින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාවේ (4) වන අනුව්‍යවස්ථාව මගින් ඒ මහාධිකරණය වෙත පවරා ඇති අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමේ දී කරන ලද ආඥාවක් වෙතින්, අභියාචනාධිකරණය වෙත ඉදිරිපත් කර ඇති යම් අභියාචනයක් විභාග කර තීරණය කරන ලෙස මහාධිකරණයකට විධාන කිරීමට මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධාන කිසිවකින් අභියාචනාධිකරණයට බලය පැවරෙන්නේ යයි කියවා තේරුම් ගනු නොලැබිය යුතු ය.

**13.** වෙනත් යම් නීතියක පටහැනිව කුමක් සඳහන්ව ඇත ද, 1987 නොවැම්බර් මස 14 වන දිනයෙන් ආරම්භව, මේ පනත ආරම්භ වන දිනයෙන් අවසන් වන කාල සීමාව තුළ දී— වලංගු කිරීම.

(අ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මගින් පිහිටුවන ලද මහාධිකරණයක, ඒ ව්‍යවස්ථාවේ (3) (අ) අනුව්‍යවස්ථාවෙන් ඒ අධිකරණය වෙත පවරා ඇති එහි අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමේ දී, පවරා ඇති සියලු නඩු කටයුතු ද, ඒ අනු ව්‍යවස්ථාව මගින් ඒ අධිකරණය වෙත පවරා ඇති මුල් අපරාධ අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමේ දී හෝ කරන ලදැයි කියනු ලබන ක්‍රියාත්මක කිරීමේ දී සටහන් කරන ලද හෝ පනවන ලද සෑම වරදකරු කිරීමක් ම, දණ්ඩන නියමයක් ම හෝ ආඥාවක් ම;

(ආ) එවැනි වරදකරු කිරීමකින්, දණ්ඩන නියමයකින් හෝ ආඥාවකින් අභියාචනාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද සෑම අභියාචනයක් ම ;

(ඇ) (ආ) ඡේදයෙහි සඳහන් යම් අභියාචනයක් මත අභියාචනාධිකරණය විසින් කරන ලද සෑම ආඥාවක් ම

මේ පනතේ විධිවිධාන 1987 නොවැම්බර් මස 14 වන දින සිට ක්‍රියාත්මකව පැවතියාක් මෙන් වලංගුව සහ බල සහිතව පැවැති ලෙසත්, පවත්නා ලෙසත් සලකනු ලැබිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත් විය යුතු බව.

14. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 177 කි. (විදේශීය) රු. 236 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.